ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

අවසාන පරීක්ෂණය 2004/2005

අධ්‍යාපන කළමනාකරණය - **ESP 1108**

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.07.23 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

**I** වන කොටසේ සියළුම ප්‍රශ්නවලටත් **II** කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## <u>I කොටස</u>

01. පිළිගත් නිර්වචනයක් සපයමින් "කළමනාකරණය" යන සංකල්පය පැහැදිලි කරන්න.

02. "කළමනාකරණය" සහ "පරිපාලනය" අතර වෙනස්කම් මොනවා ද?

03. "කළමනාකරණ ක්‍රියාවලිය" කෙටියෙන් පැහැදිලි කරන්න.

04. පාසල් කටයුතු සැලසුම් කිරීමේ අවශ්‍යතාව පෙන්වීමට හේතු <u>පහක්</u> සපයන්න.

05. ඔබගේ පාසලේ සංවිධාන සටහන ඇඳ දක්වමින් පාසලේ වර්ගයද සඳහන් කරන්න.

06. පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරයකුගේ කළමනාකරණ කාර්‍යයන් <u>පහක්</u> සඳහන් කරන්න.

07. පාසලක "කාර්යක්ෂමතාව" සහ "ඵලදායීතාව" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

08. "සායනික අධීක්ෂණය" යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේ ද?

(ලකුණු 5 x 8 = 40)

## II කොටස

09. පහත සඳහන් සාධක අතුරින් තුනක් පාසලක ඵලදායී කළමනාකරණය සඳහා බලපාන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න.

i. පාසලෙහි මානව සම්පත්

ii. පාසලෙහි භෞතික සම්පත්

iii. පාසල් ප්‍රජා සබඳතා වැඩ පිළිවෙල

iv. විදුහල්පතිගේ කළමනාකරණ කුසලතා

v. විදුහල්පතිගේ උපදේශන නායකත්වය (ලකුණු 20)

10. i. ශ්‍රී ලංකාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අධ්‍යාපන කළමනාකරණයට සිදු වූ බලපෑම් විස්තර කරන්න. (ලකුණු 06)

ii. පාසැල් මට්ටමට තීරණ ගැනීමේ බලතල විමධ්‍යගත කිරීමට හේතු තුනක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. පාසල් මට්ටමට තීරණ ගැනීමේ බලතල විමධ්‍යගත කිරීමේ වාසි සහ අවාසි සඳහන් කරන්න. (ලකුණු 07)

11. i. ඵලදායී පාසලක ලක්ෂණ හතරක් සඳහන් කර, පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. ඵලදායී පාසලක විදුහල්පතිගේ භූමිකා කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 08)

iii. ඵලදායී පාසලක් ඇගයීම සඳහා සැසඳුම් ලැයිස්තුවක් සකස් කරන්න. (ලකුණු 08)

12. i. ශ්‍රී ලංකාවේ වර්තමාන පාසල් කළමනාකරණ ගැටළු <u>හතරක්</u> සඳහන් කරන්න. (ලකුණු 04)

ii. ශ්‍රී ලංකාවේ වර්තමාන පාසල් කළමනාකරණ ගැටළුවලට හේතු විභාග කරන්න. (ලකුණු 08)

iii. ඉහත සඳහන් කරන ලද පාසල් කළමනාකරණ ගැටළුවලට ප්‍රායෝගික විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 08)

13. පහත සඳහන් මාතෘකා <u>තුනක්</u> සඳහා, කෙටි සටහන් ලියන්න.

i. පාසල් සංවර්ධන මණ්ඩලය

ii. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

iii. පාසල් පාදක කළමනාකරණය

iv. අවස්ථානුකූල කළමනාකරණය

v. පාසල් කළමනාකරණයේදී විෂයය සමායෝජකගේ භූමිකාව (ලකුණු 20)

14. i. විදුහල්පතිවරුන් සඳහා වන පුහුණු වැඩ සටහනකදී ආවරණය විය යුතු ප්‍රධාන අංශ තුනක් සඳහන් කරන්න.

(ලකුණු 04)

ii. ඔබ, විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. පාසල් කාර්‍යමණ්ඩල පුහුණු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ භූමිකාව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 100)

- හිමිකම් ඇවිරිණි. -